සැ. යු. - 2020.04.03 අංක 2170, 2020.04.09 අං 2171, 2020.04.17 අංක 2172, 2020.04.24 අංක 2173, 2020.04.30 අංක 2174, 2020.05.06 අංක 2175, 2020.05.15 අංක 2176 හා 2020.05.22 අංක 2177 ගැසට් පත්‍ර පළ නොවූ බව දන්වා සිටිනු ලැබේ. (Covid – 19 වසංගත තත්වය හේතුවෙනි).

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,178 - 2020 මැයි මස 29 වැනි සිකුරාදා - 2020.05.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 954 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 957 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ජුනි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජුනි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**විශේෂ නිවේදනයයි**

Covid – 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ ක්‍රියාත්මක නිරෝධායන කටයුතු නිසා 2020.03.16 දින සිට 2020.05.11 දින දක්වා රාජ්‍ය හා පෞද්ගලික ආයතන විවෘත කර නොතිබූ බැවින් රජයේ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා කිසිදු නිවේදනයක් රජයේ මුද්‍රණාලයට නොලැබුණි.

---

# පළාත් පාලන නිවේදන

## පන්විල ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පන්විල ප්‍රාදේශීය සභාව විසින් 2019 දෙසැම්බර් මස 27 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී තීරණ අංක ඉ.01.XVI යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ජී. සෙනවිරත්න,<br>
සභාපති,<br>
පන්විල ප්‍රාදේශීය සභාව.

2020 පෙබරවාරි මස 05 වැනි දින,<br>
කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලැබූ 2016.02.23 වැනි දින අංක 1955/7 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්* පත්‍රයේ IV(ආ) වන කොටසේ පළ කරනු ලැබූ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2017.05.05 වැනි දින අංක 2017/42 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්* පත්‍රයේ IV (ආ) වන කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දවූද ප්‍රාදේශීය සභාවල සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට්* පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ යටතේ මෙයින් යෝජනා කරමි.

1. ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථා.
2. සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
3. ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
4. මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථා
5. සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා
6. බදු අයකරගැනීම කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබාගැනීමේ අතුරු ව්‍යවස්ථා

7. පිඩාකාරී ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තර්දයක ව්‍යපාර
8. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
9. ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථා
10. සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා
11. පොදු වැසිකිලි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා
12. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
13. සත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා
14. කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
15. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
16. පෞද්ගලික ඉගැනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
17. ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා
18. ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

මෙම යෝජනාව *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්* පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කිරීමටත් ඊට පෙර දින මධ්‍යම රාත්‍රී 12 සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුනු අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වූ 2018.02.23 දින අංක 2060 *ගැසට් පත්‍රය* මගින් පළකරනු ලැබූ අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 දෙසැම්බර් මස 27 වැනි දින සභාවේ තීරණ අංක ඉ.01. XVI යටතේ මෙයින් යෝජනා කරමි.

05 - 08

---

**වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව**

නෙල්ලියඩි නවීන වෙළෙඳ පොළේ පොලිතීන් හා ප්ලාස්ටික්වලින් සෑදූ එක වරක් භාවිතා කරන කෝප්ප භාවිතය තහනම් කිරීම - 2020

වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාවේ පාලනයට අයත් නෙල්ලියඩි නවීන වෙළෙඳ පොළේ පොලිතීන් හා ප්ලාස්ටික්වලින් සෑදූ එක් වරක් භාවිතා කරන කෝප්ප භාවිතය තහනම් කිරීම සම්බන්ධයෙන් 2020.03.02 වැනි දින අංක 20(1)/2020.03.02 දරන සභාවේ යෝජනාව සම්මත කර ඇති බව මෙයින් දනුම් දෙමි.

ත. අයිංකරන්,<br>
සභාපති,<br>
වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව.

2020 මාර්තු මස 04 වැනි දින.<br>
ප්‍රාදේශීය සභා කාර්යාලය,<br>
කරවෙඩ්ඩි,

**යෝජනාව**

නෙල්ලියඩි නවීන වෙළෙඳ පොළේ පොලිතීන් හා ප්ලාස්ටික්වලින් සෑදූ එක වරක් භාවිතා කරන කෝප්ප භාවිතය 2020.03.01 දින සිට සම්පූර්ණයෙන් තහනම් කළ යුතු බව තීරණය කර ඇත.

05 - 09/1

## වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව

### නෙල්ලියඩි බස් නැවතුම් පොළ ඉදිරිපිට ඇති ත්‍රිරෝද රථ නැවතුම් පොළ තහනම් කිරීම - 2020

උතුරු පළාත් පළාත් පාලන කටයුතු භාරව ඇති අමාත්‍යාංශය විසින් පිළියෙල කර 2016.02.02 දිනැති අංක 1952/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4(අ)හි පළ කර උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කර 2017.03.24 වැනි දිනැති අංක 2011/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4(අ) හි පළ කර ඇති උතුරු පළාත් ප්‍රාදේශීය සභා සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ 4 වන පරිච්ඡේදයේ II වන වගන්තියේ සඳහන් කර ඇති අතුරු ව්‍යවස්ථාවට අනුකූලව හා මෙම අතුරු ව්‍යවස්ථා පිළිගැනීම සම්බන්ධව වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව විසින් 2017.07.07 දිනැති අංක 2027 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4(ආ)හි පළ කර ඇති තීරණයට අනුව නෙල්ලියඩි බස් නැවතුම් පොළ ඉදිරිපිට ඇති ත්‍රීරෝද රථ නැවතුම් පොළ තහනම් කිරීම සම්බන්ධයෙන් 2020.03.02 වැනි දිනැති අංක 20(II) 2020.03.02 දරන සභාවේ යෝජනාව සම්මත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ත. අයිංකරන්,
සභාපති,
වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව.

2020 මාර්තු මස 04 දින.
ප්‍රාදේශීය සභා කාර්යාලය,
කරවෙඩ්ඩි,

**යෝජනාව**

වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව නෙල්ලියඩි බස් නැවතුම් පොළ ඉදිරිපිට ඇති ත්‍රීරෝද රථ නැවතුම් පොළ තහනම් කරන අතර වෙනත් සුදුසු ස්ථානයකට මාරු කළ යුතු බව තීරණය කර ඇත.

05 - 09/2

---

## වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව

### පාසල් දිනවල බරවාහන පාලනය කිරීම

උතුරු පළාත් පළාත් පාලන කටයුතුවලට භාරව ඇති අමාත්‍යාංශය විසින් පිළියෙල කර 2016.02.02 දිනැති අංක 1952/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4(අ) හි පළ කර උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කර 2017.03.24 වැනි දිනැති අංක 2011/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4(අ)හි පළ කර ඇති උතුරු පළාත් ප්‍රාදේශීය සභා සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ II වන වගන්තියේ සඳහන් කර ඇති අතුරු ව්‍යවස්ථාට අනුකූලව හා මෙම අතුරු ව්‍යවස්ථා පිළිගැනීම සම්බන්ධව වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව විසින් 2017.07.07 දිනැති අංක 2027 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4(ආ) හි පළ කර ඇති තීරණයට අනුව වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභා සීමාවේ පාසල් දිනවල බර වාහන පාලනය කිරීම සම්බන්ධයෙන් 2019.11.18 වැනි දින අංක 49/2019.11.18 දරන සභාවේ යෝජනාව සම්මත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ත. අයිංකරන්,
සභාපති,
වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව.

2020 මාර්තු මස 04 දින.
ප්‍රාදේශීය සභා කාර්යාලය,
කරවෙඩ්ඩි,

**යෝජනාව**

වදිරි හන්දිය සිට මාලි හන්දිය දක්වාත් හා වදිරි හන්දිය සිට ශුද්ධ හෘදය විද්‍යාලය දක්වාත් පාසල් දිනවල පෙරවරු 7.00 සිට 8.00 දක්වාත් පස්වරු 1.00 සිට 2.00 දක්වාත් එම වීදි දිගේ බරවාහන කිසිවක් ධාවනය කිරීම හා රඳවා තැබීම තහනම් කළ යුතු බව තීරණය කර ඇත.

05 - 09/3

**වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව**

ත්‍රීරෝද රථ නැවතුම් පොළ භාවිතා කරන ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීම - 2020

උතුරු පළාත්, පළාත් පාලන කටයුතුවලට භාරව ඇති අමාත්‍යාංශය විසින් පිළියෙල කර 2016.02.02 දිනැති අංක 1952/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 4(අ) හි පළ කර උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කර 2017.03.24 වැනි දිනැති අංක 2011/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ 4(අ)හි පළ කර ඇති උතුරු පළාත් ප්‍රාදේශීය සභා සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ 4 වන පරිච්ඡේදයේ II වන වගන්තියේ සඳහන් කර ඇති අතුරු ව්‍යවස්ථාවට අනුකූලව හා මෙම අතුරු ව්‍යවස්ථා පිළිගැනීම සම්බන්ධව වඩමාරඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව විසින් 2017.07.07 දිනැති අංක 2027 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 4(ආ) හි පළ කර ඇති තීරණයට අනුව නෙල්ලියඩි නගර කොට්ඨාසයේ ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරන ලද ත්‍රීරෝද රථ නැවැතුම් පොළ භාවිතා කරන ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් 2020.03.02 දිනැති අංක 20(III)/2020.03.02 දරන සභාවේ යෝජනාව සම්මත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ත. අයිංකරන්,
සභාපති,
වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව.

2020 මාර්තු මස 04 වැනි දින.
ප්‍රාදේශීය සභා කාර්යාලය,
කරවෙඩ්ඩි,

**යෝජනාව**

නෙල්ලියඩි නගර කොට්ඨාසයේ ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරන ලද ත්‍රීරෝද රථ නැවතුම් පොළ භාවිතා කරන ත්‍රීරෝද රථ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කරන අතර නැවතුම් පොළේ ත්‍රීරෝද රථ රඳවා තැබීමේ ගාස්තුව වශයෙන් මාසිකව රු. 500.00ක මුදලක් ප්‍රාදේශීය සභාව අය කිරීමට කටයුතු කළ යුතුයි. තවද නැවතුම් පොළ භාවිතා කරන ත්‍රීරෝද රථ රියදුරන් ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කෙරෙන නියෝගවලට අනුව කටයුතු කළ යුතු බවත් තීරණය කර ඇත.

05 - 09/4

---

# විවිධ දැන්වීම්

**කාරෙයිනගර් ප්‍රාදේශීය සභාව**

ආදයම් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 24(03) යන වගන්තිය පරිදි දිස්ත්‍රික්කයේ කාරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ 12.12.2019 වැනි දින අංක 293 වැනි ආඥපනතට අනුව කාරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ බල සීමාවලින් පිහිටා ඇති පහතින් ඇති උපලේඛනයේ සඳහන් ආදයම් අය කිරීම් කාරෙයිනගර් ප්‍රාදේශීය සභාවට අයිති/හිමිකාරය ආදයම බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වි. කෙනිස්වරදාස්,
සභාපති,
කාරෙයිනගර් ප්‍රාදේශීය සභාව.

2020 ජනවාරි මස 01 වැනි දින,
කාරෙයිනගර් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## කාරෙයිනගර් ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු පැනවීම - 2020

මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට බලාත්මකවන පරිදි ප්‍රචාරක දැන්වීම් සඳහා පහත උපලේඛනයට අනුව ගාස්තු පනවා අයකළ යුතු යැයි 2019.12.12 වැනි දින අංක 293 දරන තීරණය මගින් තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

වී. කෙනිස්වරදස්,
සභාපති.
කාරෙයිනගර් ප්‍රාදේශීය සභාව,
කාරෙයිනගර්.

කාරෙයිනගර් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | *කාලය* | |
|---|---|---|---|
| | | *මාස 03කට* *රු. ශ.* | *මාස 13කට* *රු. ශ.* |
| 1. | කොඩි දැන්වීම් - වර්ග අඩි 01කට | 10 0 | 40 0 |
| 2. | ආලෝකකරණය සහිත දැන්වීම් - වර්ග අඩි 01කට | - | 100 0 |
| 3. | අලෝකකරණය රහිත දැන්වීම් - වර්ග අඩි 01කට | - | 50 0 |
| 4. | තාප්ප දැන්වීම් - වර්ග අඩි 01කට | - | 50 0 |

### කාරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ ජල ගාස්තුව සහ ටැංකිය කුලියට දෙන ගාස්තුව

මේ දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට ක්‍රියා කළ යුතු ලෙස ජල ටැංකිය කුලියට දීම ජල සැපයුම් නිමිතතෙන් නියෝග කර ගාස්තු අයකරන ලෙස නියමනය මගින් තීරණය කළ බව අංක 293(5), 2019.12.12 වැනි දින මෙයින් දන්වනු ලැබේ.

වී. කෙනිස්වරදස්,
සභාපති.
කාරෙයිනගර් ප්‍රාදේශීය සභාව,
කාරෙයිනගර්.

2020 ජනවාරි මස 01 වැනි දින,
කාරෙයිනගර් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *ක්‍රියාව* | *ගාස්තුව* |
|---|---|---|
| 01. | ලීටර් 1000 පානීය ජලය | 800 0 |
| 02. | වතුර ටැංකිය (දවසකට) | 250 0 |
| 03. | වතුර ටැංකිය පැටවීම බාවීම ගාස්තු | 400 0 |
| 04. | ගල්රෝල කුලියට දිනකට | 500 0 |
| 05. | බැකෝ යන්ත්‍රය කුලියට දිනකට | 3,000 0 |

05-13

**මහනුවර මහා නගර සභාව**

අපඅජල ගාස්තු චක්‍රය

**අපවිත්‍ර ජල කළමනාකරණ පද්ධතියට අදළ වූ අතුරු ව්‍යවස්ථාව**

*15.1 වගන්තිය අනුව දන්වීම*

මහනුවර මහා නගර සභාවේ අපජල පද්ධතියට සම්බන්ධවීම හරහා අපජලය බැහැර කිරීමේ සේවය සඳහා සකස් කරන ලද ගාස්තු චක්‍රයට 2019.09.26 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 8(12) යටතේ අනුමැතිය ලැබී ඇත. මේ අනුව මහනුවර මහා නගර සභාවේ අපජල පද්ධතියට සම්බන්ධවීම හරහා අපජලය බැහැර කිරීමේ සේවය ලබා ගන්නා සියලුම පාරිභෝගිකයන්ගෙන් පහත සඳහන් ගාස්තු ප්‍රමාණය 2020.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අය කරනු ලබන බව 2011.05.30 වන දින අපවිත්‍ර ජල කළමනාකරණ පද්ධතියට අදළ වූ අතුරු ව්‍යවස්ථාවේ 15.1 වගන්තිය ප්‍රකාරව මෙයින් දනුම් දෙනු ලැබේ.

කේසර ඩී. සේනානායක,
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2020 මැයි මස 18 වැනි දින,
මහනුවර මහා නගර සභාව.

**ගාස්තු ප්‍රමාණය 01**

ගෘහස්ත

| *ඒකක ගණන* | *පරිහරණ ගාස්තුව රු./ඒකකය (බදු රහිත)* |
|---|---|
| 10ට අඩු | 50.00 (ස්ථාවර) |
| 11-20 | 100.00 (ස්ථාවර) |
| 21 හෝ ඊට වැඩි | 30.00 බැගින් |

**ගාස්තු ප්‍රමාණය 02**

ගෘහස්ත නොවන

| *ඒකක ගණන* | *පරිහරණ ගාස්තුව රු./ඒකකය (බදු රහිත)* |
|---|---|
| 40ට අඩු | 51.00 බැගින් |
| 41-150 | 64.00 බැගින් |
| 151 හෝ ඊට වැඩි | 77.00 බැගින් |

**ගාස්තු ප්‍රමාණය 03**

පුණ්‍යායතන

| *ඒකක ගණන* | *පරිහරණ ගාස්තුව රු./ඒකකය (බදු රහිත)* |
|---|---|
| සියලුම ඒකක | 05.00 බැගින් |

**ගාස්තු ප්‍රමාණය 04**

පාසල් සහ නොමිලේ ලබා දෙන ස්ථාන

| *ඒකක ගණන* | *පරිහරණ ගාස්තුව රු./ඒකකය* |
|---|---|
| සියලුම ඒකක | නොමිලේ |

06 -04

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.